සැ. යු.- 2016.12.30 වැනි දින පළ වූ අංක 2,000 දරන *ගැසට් පත්‍රයේ* I : II (අ), III සහ IV (අ) කොටස් පළ නොවේ ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,001 - 2017 ජනවාරි මස 06 වැනි සිකුරාදා - 2017.01.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 02 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 03 |


*සැ. යු.* - ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත් කෙටුම්පත 2016 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 ජනවාරි මස 27 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ජනවාරි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1- B 081131— 353 (2017/01)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීම

## කොළඹ දිසා අධිකරණයේ දී ය

කොළඹ දිසා අධිකරණයේ
නඩු අංක : D. D. R. 119/2015
ස්වභාවය : ඩී.ඩී.ආර්.
කාර්ය පටිපාටිය : ලඝු
වටිනාකම : රු. 2,700,000/-
ගම්පහ දිසා අධිකරණයේ
ඇස්කීසි අංක : 47/2016

සංශෝධිත පරිදි වූ 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සහ ඊට අනුකූල නෛසයි තීන්දු ප්‍රකාශයක් සහ නියත තීන්දු ප්‍රකාශයක් සඳහා ඉල්ලීම පිළිබඳ කාරණයේ දී ය.

කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 (කලින් අංක 481) දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ කොළඹ, කොළඹ 10 මාලිගාවත්ත, මාලිගාවත්ත මහලේකම් කාර්යාලයෙහි ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.

........................................ *පැමිණිලිකරු.*

*එදිරිව*

මහරගේ චතුර දනුද්දර ආරියරත්න,
අංක 47/14, වේරළුගොල්ල වත්ත,
වටද්දර, වේයන්ගොඩ.

.................................................. *විත්තිකරු.*

ඉහත අංක සඳහන් නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කීසියට අනුව පහත උපලේඛනයේ සඳහන් දේපළ 2016 ක් වූ මැයි මස 24 වැනි දින මා විසින් තහනම් කිරීමෙන් පසු ඉහත නම් සඳහන් විත්තිකරු විසින් නෛසයි තීන්දු ප්‍රකාශිත මුදල පැමිණිලිකාර බැංකුවට ගෙවීම පැහැර හැර ඇති හෙයින්, රු. 681,593.83 ක මුදලක් සහ 2015 මාර්තු මස 01 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් ඒ සඳහා 15% බැගින් වාර්ෂික පොලිය ද, රු. 1,386,359.40 ක මුදලක් සහ 2015 මාර්තු මස 01 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ සඳහා 16% බැගින් වූ වාර්ෂික පොලිය ද, රු. 559,154.40 ක මුදලක් සඳහා 2015 මාර්තු මස 01 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ සඳහා 18% බැගින් වාර්ෂික පොලිය ද, නඩු ගාස්තු ද විත්තිකරු විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට තීරණය කර ඇති අතර, එකී ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති හෙයින් කොළඹ දිසා අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රය පිට 2016 මැයි මස 24 වැනි දින තහනමට ගෙන ඇති විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ, වර්ෂ 2017ක් වූ පෙබරවාරි මස 15 වැනි දින ප. ව. 2.30ට විත්තිකරුගේ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් පිස්කල් වෙන්දේසියේ විකුණනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් සියයට විසිපහක (25%) මුදලක් ද පිස්කල් ගාස්තු, රජයට අය විය යුතු ගාස්තු, තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට් පත්‍රයේ* සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් එවලේම මුදලින් මා වෙත ගෙවිය යුතු ය. චෙක් පත් භාරගනු නොලැබේ. ගැනුම් මිලෙන් සියයට හැත්තෑ පහක (75%) ඉතිරි මුදල දින 30ක් ඇතුළත ගම්පහ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

*දේපළ පිහිටි ස්ථානයට ප්‍රවේශ වන මාර්ගය.-* කොළඹ නුවර පාරේ මිරිස්වත්ත හන්දියෙන් දකුණට හැරී වත්තේගම පාරේ කි. මී. 2.5 පමණ ඉදිරියට ගොස් කීනිගම හන්දියෙන් දකුණට ඇති සමගි මාවතේ මීටර් 200ක් පමණ ඉදිරියට ගියවිට ද ෆිනෑන්ස් සමාගම විසින් මැතක දී වෙන්දේසි කරන ලද කැබලි අංක 07 දරන බිම් කොටස පිහිටා ඇත.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ මහර ප්‍රාදේශීය සභාවේ උරුවල්පොරුව මල්වතු හිරිපිටිය/බුත්පිටිය අංක 05 උපකාර්යාල සීමාවේ පිටුවල්ගොඩ පිහිටි නාගහහේන සහ මිල්ලගහවත්ත නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. ඒ. නිහාල් විසින් පිඹුරුපත් අංක 1986 යටතේ 2007 සැප්තැම්බර් මස 22 වැනි දින මැන බෙදා වෙන්කර සකස් කරන ලද කැබලි අංක 07ට, උතුරට : කැබලි අංක 19 හා 01න් ද, නැගෙනහිරට : සෝමා සුහසිංහට අයත් ඉඩමෙන් ද, දකුණට : කැබලි අංක 08 හා 06න් ද, බස්නාහිරට : කැබලි අංක 06 හා 19 න් ද, මායිම් වූ පිඹුරුපත් අංක 1986 ට අනුව පර්චස් දහතුනයි දශම දෙකයි බිංදුවකින් ද සමන්විත (අක්. 0, රූඩ්. 0, පර්. 13.20) ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරු අංක E 890/240 හි ලියාපදිංචි කර ඇත. මාර්ග අයිතිය සඳහා පත්ඉරු අංක E 890/239 සහ E 890/238 බලන්න.

### දෙවන උපලේඛනය

01. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ මහර ප්‍රාදේශීය සභාවේ උරුවල්පොරුව මල්වතු හිරිපිටිය/බුත්පිටිය අංක 05 උපකාර්යාල සීමාවේ පිටුවල්ගොඩ පිහිටි නාගහහේන සහ මිල්ලගහවත්ත නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. ඒ. නිහාල් විසින් පිඹුරුපත් අංක 1986 යටතේ 2007 සැප්තැම්බර් මස 22 වැනි දින මැන බෙද වෙන්කර සකස් කරන ලද කැබලි අංක 13 ට (පාර සඳහා වෙන්කරන ලද) ඉඩමට උතුරට : කැබලි අංක 18 හා 06න් ද, නැගෙනහිරට : කැබලි අංක 06,08,18,17 සහ රංජිත් සුභසිංහගේ ඉඩමෙන් ද, දකුණට : පාරෙන් ද, බස්නාහිරට : කැබලි අංක 20,16,14,12,11,10,09,05 සහ 19න් ද, මායිම් වූ පිඹුරුපත් අංක 1986 ට අනුව පර්චස් විසිහයයි දශම අටයි බිංදුවකින් ද, සමන්විත (අක්. 0, රූ. 0, පර්. 26.80) ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරු අංක E 890/239 හි ලියාපදිංචි කර ඇත.

02. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය සභාවේ උරුවල්පොරුව මල්වතු හිරිපිටිය/බුත්පිටිය අංක 05 උපකාර්යාල සීමාවේ පිටුවල්ගොඩ පිහිටි නාගහහේන සහ මිල්ලගහවත්ත නමින් හඳුන්වන ඉඩමට බලයලත් මානක ඩබ්ලිව්. ඒ. නිහාල් විසින් පිඹුරුපත් අංක 1986 යටතේ 2007 සැප්තැම්බර් 22 වැනි දින මැන බෙද වෙන්කර සකස් කරන ලද කැබලි අංක 19ට (පාර සඳහා වෙන්කරන ලද) උතුරට : කැබලි අංක 03, 02 හා 01න් ද, නැගෙනහිරට : කැබලි අංක 01 හා 07න් ද, දකුණට : කැබලි අංක 07, 06, 13 හා 05න් ද, බස්නාහිරට : කැබලි අංක 04න් ද, මායිම් වූ පිඹුරුපත් අංක 1986 ට අනුව පර්චස් හයයි දශම දෙකයි බිංදුවකින් ද සමන්විත (අක්. 0, රූ. 0, පර්. 6.20) ගම්පහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ පත්ඉරු අංක E 890/238 හි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,<br>
දිසා අධිකරණය,<br>
ගම්පහ.

2016 දෙසැම්බර් මස 22 වැනි දින දී ය.

01-158

---

# විවිධ දැන්වීම්

## කොළඹ දී පැවැත්වෙන (වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන) බස්නාහිර පළාතේ පළාත්බද මහාධිකරණයේ දී ය

බණ්ඩාරගම, රඹුක්කන, පහලමුල්ල පාර, අංක 21/1 දරන ස්ථානයෙහි පිහිටි ජී එස් අයි ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් සම්බන්ධ කාරණාවකි.

*නඩු අංකය* : එච්. සී. (සිවිල්) 69/2016/CO.<br>
*ස්වභාවය* : ඈවර කිරීම්

*සහ*

2007 අංක 07 දරන සමාගම් පනතේ 270 (අ) සහ/හෝ (ඉ) සහ/හෝ (ඊ) වගන්තිය යටතේ අධිකරණය විසින් ජී එස් අයි ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් ණණන් බේරා වසා දැමීම සඳහා කරනු ලබන ඉල්ලීමකි.

බණ්ඩාරගම, රඹුක්කන, පහලමුල්ල පාර, අංක 21/1 දරන ස්ථානයෙහි පිහිටි ජී එස් අයි ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

.......................................... *පෙත්සම්කරු.*

කොළඹ දී පැවැත්වෙන (වාණිජ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන) බස්නාහිර පළාතේ පළාත් බද මහාධිකරණය විසින් ඉහත නම සඳහන් සමාගම ණණන් බේරා වසා දැමීම සඳහා 21/1 දරන ස්ථානයෙහි පිහිටි ජී. එස්. අයි. ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම වර්ෂ 2016ක් වූ නොවැම්බර් මස 29 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම වර්ෂ 2017 ක් වූ ජනවාරි මස 16 වැනි දින අධිකරණය ඉදිරියේ ඇසිය යුතු බවට නියම කරන ලද බවත් එකී පෙත්සම මත නියෝගයක් කිරීම සම්බන්ධව සහයෝගය දැක්වීමට හෝ විරෝධය දැක්වීමට කැමති එකී සමාගමේ ණය හිමියෙකු හෝ දායකයෙකු එකී පෙත්සම අසන වේලාවේ දී පුද්ගලිකව හෝ නීතිඥ මහතෙකු හෝ ලේඛණගත නීතිඥ මහතෙකු මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බවත් මෙයින් දන්වනු ලැබේ. තව ද, ඉහත කී පෙත්සමේ පිටපතක් ඒ සඳහා වන ගාස්තු ගෙවීම මත එය අවශ්‍ය වන සමාගමේ යම් ණය හිමියෙකුට හෝ දායකයෙකුට පහත අත්සන් කරනු ලබන අය විසින් සපයනු ලබන්නේ ය.

ජෝන් විල්සන් පාට්නර්ස්,
නීතිඥවරු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරු,
අංක 365, වේල්ල වීදිය,
කොළඹ 12.

***සටහන.***- එකී පෙත්සම ඇසීමේ දී අධිකරණයේ පෙනී සිටීමට අදහස් කරන යම් අයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම සඳහන් නීතිඥ සමාගම වන ජෝන් විල්සන් පාට්නර්ස් නීතිඥවරුන් වෙත ලිඛිතව හෝ පැමිණ හෝ තැපැල් මගින් භාර දිය යුතු ය. පුද්ගලයින්ගේ නම් සහ ලිපිනයන් හෝ යම් ව්‍යාපාරික ආයතනයක් නම් එහි නම සහ ලිපිනය නොතීසියේ සඳහන් කිරීම අවශ්‍ය වන අතර එම පුද්ගලයා හෝ ව්‍යාපාරික ආයතනය හෝ සිය නීතිඥවරුන් ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීම හා එය වර්ෂ 2017ක් වූ ජනවාරි මස 15 වැනි දින පස්වරු හය (ප. ව. 6.00) ට පෙර ඉහත නම සඳහන් නීතිඥ සමාගමට ලැබෙන සේ කල්වේලා ඇතිව භාර දීම හෝ තැපැල් කිරීම අවශ්‍ය වේ.

ජෝන් විල්සන් පාට්නර්ස්,
නීතිඥවරු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරු,
අංක 365, වේල්ල වීදිය,
කොළඹ 12.

රෙජිස්ට්‍රාර්,
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

01-118

---

## ''සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරින්ගේ සංගමය'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

වෛද්‍ය තුසිතා විජේමාන්න නැමති මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ ''සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ සංගමය'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී ''සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරින්ගේ සංගමය'' සංස්ථාගත කිරීමයි :-

(අ) දේවාල ආශ්‍රිත ඒ ඒ දේවාලයන්හි ආවේණික ඉපැරණි සම්ප්‍රදයන්/සිරිත් විරිත්/වත් පිළිවෙත්/චාරිත්‍ර වාරිත්‍ර, ආගමික කටයුතු ආරක්ෂා කොට ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා පියවර ගැනීම,

(ආ) දේවාලවල පාරම්පරික නිලධාරින්ගේ උරුම, අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ මැදිහත්වීම, සහ

(ඇ) යම් සාමාජිකයෙකුට නීතිමය හා වෙනත් අයුරකින් සිදුවන ගැටලුකාරී තත්ත්වයන්හි දී මැදිහත්කරුවෙකු ලෙස සංගමයේ සහයෝගය ලබාදීම,

යනාදිය වේ.

වෛද්‍ය තුසිතා විජේමාන්න මිය,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කෑගල්ල දිස්ත්‍රික්කය.

01-164

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | | | |
| **ජනවාරි** | 2017.01.06 | සිකුරාදා | 2016.12.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.01.13 | සිකුරාදා | 2016.12.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.01.20 | සිකුරාදා | 2017.01.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.01.27 | සිකුරාදා | 2017.01.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2017.02.03 | සිකුරාදා | 2017.01.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.02.09 | බ්‍රහස්පතින්දා | 2017.01.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.02.17 | සිකුරාදා | 2017.02.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.02.23 | බ්‍රහස්පතින්දා | 2017.02.09 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2017.03.03 | සිකුරාදා | 2017.02.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.10 | සිකුරාදා | 2017.02.23 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2017.03.17 | සිකුරාදා | 2017.03.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.24 | සිකුරාදා | 2017.03.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.03.31 | සිකුරාදා | 2017.03.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.